# ඉඩම විකිණීම සඳහා වූ ගිවිසුමයි

මෙහි පහත ඇතැම් තැනක පළමුවන පක්ෂය යැයි කියනු ලබන..................................................................................................................................................
......................................................................................................................................................................හි
පදිංචි..............................................................................................................................................................................
............................................................................................වන අය එක් පක්ෂයකට ද,

මෙහි පහත දෙවන පාර්ශවය යැයි කියනු ලබන පානදුර ඩී.එස්. සේනානායක මාවතේ අංක 112/ඒ, හි පිහිටා තිබෙන මාස්ක් දේපල වෙළඳාම් පුද්ගලික සමාගම අනෙක් පක්ෂයකට ද, බැඳී වර්ෂ.................................................දින පානදුරේදී ඇති කරනු ලබන විකිණීම සඳහා වූ ගිවිසුමයි.

ඉහත පළමු පක්ෂයට බැඳුනු..........ට ප්‍රසිද්ධ නොතාරිස්...........................................................මහතා ලියා සහතික කළ වර්ෂ.................................දින සහ අංක........................දරණ ඔප්පු පිට අයිතිව නිරවුල්ව භුක්ති විඳිනු ලබන මෙහි පහත උපලේඛණයේ විස්තර කරනු ලබන දේපල අද දින සිට මාස.....................කාලය ඇතුලත විකිණීම සඳහා දෙවන පාර්ශවයට බැඳුනු මාස්ක් දේපල වෙළඳාම් පුද්ගලික සමාගමට මෙහි පහත සඳහන් කරනු ලබන කොන්දේසි වලට යටත්ව භාරදෙනු ලැබේ.

**එකී කොන්දේසි කවරේද යත්:**

1. මෙකී දේපල විකිණිය යුතු අවම මුදල පළමුවන පාර්ශවය විසින් තිරණය කරනු ලබන අතර එකී මුදල අඩු කරන්නේ නම් හෝ වැඩි කරන්නේ නම් පළමු පාර්ශවයේ එකඟත්වය මත පමණක් කළ යුතු බවට මෙයින් දෙපාර්ශවය එකඟ වේ.

2. මෙකී දේපල ගැනුම්කරුවන්ට විකිණීම සඳහා වන වියදම් හා දැන්වීම් ප්‍රචාරනය සඳහා වන වියදම් දෙවන පාර්ශවය විසින් දැරීමට එකඟ වේ.

3. මෙකී දේපල විකුණනු ලබන මුදලින් රුපියල් ලක්ෂ 25 දක්වා 3% ක් ද රුපියල් ලක්ෂ 25 සිට ලක්ෂ 50 දක්වා 2.5% ක් ද, රුපියල් ලක්ෂ 50 සිට ලක්ෂ 75 දක්වා 2% ක් ද, ලක්ෂ 75 සිට ලක්ෂ 100 දක්වා 1.5% ක් ද, ලක්ෂ 100 ට වැඩිවන සෑම ලක්ෂයකටම 1% ක් ද, වන කොමිස් මුදලක් පළමු පාර්ශවය විසින් දෙවන පක්ෂය වන මාස්ක් දේපල වෙළඳාම් පුද්ගලික සමාගමට ගෙවීමට එකඟ වේ.

4. තවද මෙකී දේපලට පළමු පාර්ශවයට දැන්වීමෙන් අනතුරුව මාස්ක් දේපල වෙළඳාම් පුද්ගලික සමාගමේ සේවකයෙකුට ඇතුල් වීමට පළමු පාර්ශවය විසින් අවසර ලබා දෙන අතර එහිදී ගැණුම්කරු සමඟ කිසිදු සබඳතාවක් නොපවත්වන බවට පළමු පාර්ශවය එකඟ වේ.

5. යම් හෙයකින් මෙකී ගිවිසුම නියමිත කාලයට පෙර අවලංගු කරන්නේ නම් හෝ මෙකී ගිවිසුම් කාලය තුල පළමු පාර්ශවය විසින් ඔහුගේ ගැණුම්කරුවකුගේ මාර්ගයෙන් දේපල විකුණනු ලබන්නේ නම් රුපියල් 15,000/-ක (රුපියල් පහළොස් දාහක) මුදලක් පළමු පාර්ශවය විසින් දෙවන පාර්ශවයට ගෙවීමට එකඟ වේ.

6. තවද මෙකී දේපල පිළිබඳ කේවියට් දැන්වීමක් ලියාපදිංචි කිරීමට දෙවන පාර්ශවයට මෙයින් අනුමැතිය ලබා දීමට පළමු පාර්ශවය එකඟ වේ.

7. මෙම ගිවිසුම් කාලය අවසන් වීමෙන් පසුවද අප ආයතනයේ ගැණුම්කරුවෙකු මෙකී දේපල විකුණනු ලැබුවහොත් අප ආයතනයට ගෙවිය යුතු ඉහත කී කොමිස් මුදල ගෙවීමට පළමු වන පාර්ශවකරු එකඟ වේ.

8. දේපල විකුණනු ලබන අවස්ථාවේදී මාස්ක් දේපල වෙළඳාම් පුද්ගලික සමාගමට අයවිය යුතු මුදල් අඩු කර ඉතිරි මුදල් පමණක් විකිණීමේ මුදල ලෙස බාර ගැනීමට පළමු පාර්ශවකරු එකඟ වේ.

ඉහත කී කොන්දේසි වලට ඉහත පළමු පාර්ශවය සහ දෙවන පාර්ශවයද ඔවුනොවුන් එකඟව වර්ෂ.................................දින දී පානදුරේදී මීටත් මේ හා සමාන තවත් ලියවිලි එකකටත් දෙපාර්ශවය අත්සන් තබන ලදී.

**<u>සාක්ෂි</u>**

1.නම : .......................................................................... ............................................

ලිපිනය : .................................................................... 1 වන පාර්ශවය

අත්සන : ..................................................................

2.නම : ........................................................................

ලිපිනය : ..................................................................

අත්සන : ....................................................................

............................................

**2 වන පාර්ශවය**

**කළමණාකාර අධ්‍යක්ෂ**

**මාස්ක් දේපල වෙළදාම් පුද්ගලික සමාගම**